# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2030/9 - 2017 ජූලි මස 31 වැනි සඳුදා - 2017.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

DIK/LAN/02/30/37.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර*:

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාතේගම මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ පාතේගම මධ්‍යම ගමේ පිහිටි මාතර ජ්‍යෝෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක මූ. පි. මාර 2701 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස් :-

**1. කැබලි අංක 01**

ඉඩමේ නම: ගොඩැල්ලහේන; විස්තරය : ගෙවත්ත සහිත මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: මලවි ආරච්චිගේ විජේසේකර, ගේගාවවත්ත, රත්මලේ; ප්‍රමාණය: හෙක්. 0.0136.

**02. කැබලි අංක 02**

ඉඩමේ නම: පරණවත්ත; විස්තරය : ගෙවත්ත සහිත මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: සිරිසේන සමරවික්‍රම, කරුණාවතී සමරවික්‍රම සහ දොන් හෙන්ද්‍රික් සමරවික්‍රම ගොඩැල්ලහේන, පාතේගම, කෝට්ටගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0121.

**03. කැබලි අංක 05**

ඉඩමේ නම: පැලවත්ත; විස්තරය : ගෙවත්ත සහිත මිශ්‍ර භෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: මලවි ආරච්චිගේ විජේසේකර, ගේගාවවත්ත, රත්මලේ; ප්‍රමාණය: හෙක්. 0.0747.

**04. කැබලි අංක 06**

ඉඩමේ නම: පැලවත්ත; විස්තරය : ගෙවත්ත සහ ළඳු කැළය; හිමිකම් කියන අය: මලවි ආරච්චිගේ විජේසේකර, ගේගාවවත්ත, රත්මලේ; ප්‍රමාණය: හෙක්. 0.00349.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 අගෝස්තු මස 31 වැනි දින පෙ. ව. 10.30 ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 අගෝස්තු මස 24 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි


1A - G 25993 - 34 (2017/07)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බී. එස්. රන්ජිත,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2017 ජූලි මස 24 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 524

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* :- KDS/PJP/4/4/2/ED/77.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* :- 4-3/8/2013/PC/53.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලසියපත්තුව සුළු කොට්ඨාසයේ, උග්ගහකුඹුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2017.05.24 දිනැතිව මැන සකස්කරන ලද අංක මහ 6593 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් සඳහන් කුරුඳුවත්තේහේන නැමැති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0126 ක් පමණ වන පහත සඳහන් මායිම්වලින් යුත් ඉඩම් කොටස.

1. **කැබලි අංක 01 - ඉඩමේ නම: කුරුඳුවත්තේහේන; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ඩී. ටී. කමලාවතී, පාසල් මාවත, මාරතුගොඩ, පූජාපිටිය; ප්‍රමාණය: හෙක්. 0.0126.**

*මායිම්*
*උතුරට* : ඇළ; *නැගෙනහිරට*: දොඹගම්මන තලගහපැලේ ගෙදර කමලාවතී හිමිකම් කියන කුරුඳුවත්තේහේන; *දකුණට*: දොඹගම්මන තලගහපැලේ ගෙදර කමලාවතී හිමිකම් කියන කුරුඳුවත්තේහේන, මූ.පි. මහ 4673 හි කැබැලි අංක 1 සහ මෙම පිඹුරේ කැබලි අංක 2; *බටහිරට*: මූ.පි. මහ 4673 හි කැබැලි අංක 1, මෙම පිඹුරේ කැබලි අංක 2 සහ ඇළ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 සැප්තැම්බර් මස 13 වැනි දින ප.ව. 1.00ට පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 සැප්තැම්බර් මස 06 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එම්. ඩබ්ලිව්. එම්. එම්. මඩහපොල,
ප්‍රාදේශීය ලේකම්,
පූජාපිටිය.

පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 525

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.